

සභාපති තෝමස් එස්. මොන්සන් විසිනි

# ගැලවුම්කරුවාණන් සඳහා කාලය සකසාගන්න

තවත් නත්තල් කාලයක්, අළුත් අවුරුද්දක උදාවකුත් සමග අප වෙත පැමිණ ඇත. අපි ගැලවුම්කරුවාණන්ගේ උපත සමරමින් තීරණ ගෙන තිබෙන්නේ මීට ටික වේලාවට පෙර බව අපට හැගේ.

මෙම වසර සඳහා අප ගත් තීරණ අතර, ගැලවුම්කරුවාණන් සඳහා අපගේ ජීවිතවල කාලයක් වෙන්කර, අපගේ සිත් තුල ඊට අප ඉඩක් තබා තිබෙනවාද? එම තීරණ වලින් අප කෙතරම් දුරට සාර්ථකවී තිබුනද, හොඳින් කටයුතුකිරීමට අපි සියල්ලෝම සිතන බව මගේ විශ්වාසයයි. අපගේ උත්සාහයන් නැවත පරීක්ෂාකර බලා, අළුත්කිරීමට හොඳම කාලය නත්තල් සමයයි.

අපගේ කාර්යබහුල ජීවිතතුල, වෙනත් බොහෝ දේවල් අපගේ අවධානය ගැනීමට තරඟකරන බැවින්, අත්‍යාවශ්‍යවන්නේ අපගේ ජීවිතවලට සහ අපගේ නිවාසවලට ක්‍රිස්තුස්වහන්සේ රැගෙනඒමට අභිප්‍රාය සහ කැපවීමය. පෙරදිගින් පැමිණි ශාස්ත්‍රවන්තයන් උන්වහන්සේගේ තාරකාව දෙස බලා “උන්වහන්සේට නමස්කාරකිරීමට පැමිණීම”[1] මෙන් අපද ස්ථිරව සිටිය යුතුය.

ඉතිහාසය මුළුල්ලේම, යේසුස්වහන්සේගේ පණිවුඩය වෙනස්වූයේ නැත. ගලීලයේ වෙරළේදී පේත්‍රුස්ට සහ අන්ද්‍රෑට “මා පස්සේ වරෙල්ලායි”[2] උන්වහන්සේ කීසේක. පිලිප්ටද එම කැඳවීමම ලැබින, “මා පස්සේ වරෙන්න”[3] සුංගම් අයකරන තැන වාඩිවී සිටි ලෙවියාටද එම උපදේශයම ලැබින, “මා පස්සේ වරෙන්න”[4] එසේම ඔබට සහ මටද, අප ඇහුම්කන්දෙන්නේ නම්, එම කැඳවීමේ අරාධනාවම එනු ඇත, “මා පස්සේ වරෙන්න”[5]

අපි අද උන්වහන්සේගේ පියවර අනුව යමින්, උන්වහන්සේගේ ආදර්ශය අනුගමනය කිරීමට උත්සාහකරන විට, අන් අයගේ ජීවිතවලට ආශිර්වාදකිරීමට අවස්ථාවන් අපට ලැබෙනු ඇත. යේසුස්වහන්සේ අපට අවංකව කැපවන ලෙස ආරාධනාකරනසේකඃ ස්වාමීන්වහන්සේ අපගෙන් අපේක්ෂාකරන්නේ, කැමති සිතක් සහ මනසකි.[6]

මේ නත්තලේදී ඔබ සේවයක් ලබාදිය යුතු යම් කෙනෙක් ඔබට සිටීද? ඔබගේ පැමිණීම බලාපොරොත්තුව යමෙක් සිටීද?

වසර ගණනාවකට පෙර, වයසක වැන්දඹුවකගේ නිවසට නත්තල් සමයේ මම ගියෙමි මා එහි සිටියදී, යමෙක් දොරේ සීනුව නාදකළේය. දොර ළග කාර්යබහුල ප්‍රසිද්ධ වෛද්‍යවරයෙක් සිටගෙන සිටියේය. ඔහුට කැඳවීමක් කර නොතිබිනිඃ නමුත් හුදකලාව සිටින රෝගියෙකු බැහැදැකීමට පෙළඹවීමක් ඔහුට ලැබී තිබින.

මෙම නත්තල් කාලයේ, සිය නිවාසවලින් බැහැරවීමට නොහැකි අය, නත්තල් බැහැදැකීමක් බලා සිටිති. එක් නත්තලකදී වැඩිහිටි නිවාසයක් බැහැදැකීමට ගිය විට, මම හිඳගෙන ,වැඩිහිටි කාන්තාවන් පස්දෙනෙක් සමග කථාකළෙමි. ඔවුන්ගෙන් වැඩිහිටිම තැනැත්තියගේ වයස 101කි, ඇය අන්ධය, එහෙත් ඇය මගේ කටහඬ හඳුනාගත්තාය.

“සභානායකතුමනි, ඔබ මෙම අවුරුද්දේ මඳක් ප්‍රමාද වැඩී!” යයි ඇය කීවාය. “ඔබ එන්නේ නැතැයි මා සිතුවා.”

අපි සතුටින් සිටියෙමු, එක් රෝගියෙක් කෙසේ වුවද, මහත් ආශාවෙන් ජනේලයෙන් පිටත බලමින්, නැවත නැවත මෙසේ කීවාය, “මා දන්නවා මගේ පුතා මා බලන්ට අද එන බව.” ඔහු පැමිණියේදැයි මම කල්පනා කළෙමි. ඊට පෙර ඔහු නොපැමිණි නත්තල් කාල බොහෝ තිබින.

අපගේ උපකාරක හස්තයක්, ආදරණීය සිතක් සහ ප්‍රියමනාප ආත්මයක් දිගුකිරීමට මෙම වසරේ තවමත් කාලය ඇත—වෙනත් වචනවලින් කිවහොත්, අපගේ ගැලවුම්කරුවා-

ණන් තැබූ ආදර්ශය අනුව යමින්, අප සේවය ලැබීමට කැමති ලෙස, අන් අයටද සේවය කිරීමය. අප උන්වහන්සේට සේවයකරන විට, අපගේ අවස්ථාවන් අපට අහිමි නොවේ, පැරණි තානායම්කරුකළ ලෙස,[7] අපගේ ජීවිත තුල උන්වහන්සේ හට කාලය වෙන්කිරීම සහ අපගේ සිත් තුල උන්වහන්සේට ඉඩක් තැබීමත්ය.

කෙතේ සිටි එඬේරුන්ට දේවදූතයා දුන් පණිවුඩයේ ඇතුලත් විශිෂ්ට පොරොන්දුව අවබෝධකරගැනීමට අපට පුළුවන්ද: "මම නුඹලාට මහත් ප්‍රීති උපදවන යහපත් ආරංචි ගෙන එමි. ... මක්නිසාද ස්වාමිවූ ක්‍රිස්තුස් නම්, ගැලවුම්කාරයෙක් නුඹලාට ... අද උපන්සේක"?[8]

අපි නත්තල් තෑගි හුවමාරුකරගන්නා විට, සියලුම තෑගිවලට වඩා උතුම් තෑග්ග—අපගේ ගැලවුම්කරුවාණන් සහ මිදුම්කරුවාණන්ගේ ත්‍යාගය වන, අපට සදාකල ජීවනය ලැබීමේ ත්‍යාගය, කෘතඥපූර්වකව ලබාගැනීමට අපට සිහිපත් වේවා!

මිනිසෙකුට දානයකරන ත්‍යාගය ඔහු ලබානොගන්නේ නම් ඔහුට එයින් කිනම් ප්‍රයෝජනයක්ද? ඔහුට දුන් ඒ දෙයින් ඔහු ප්‍රීතියට පත්නොවේ, එම ත්‍යාගය දුන් පුද්ගලයාද, එයින් ප්‍රීතියට පත් නොවන්නේය.[9]

උන්වහන්සේ අනුව ගොස්, උන්වහන්සේට සේවයකිරීමට, ගෞරවකිරීමට, උන්වහන්සේ අපට දෙන ත්‍යාගය අපේ ජීවතවලට ලබාගැනීමට අපට හැකිවී, ලෙහී පියාගේ මෙම වචනවූ, "උන්වහන්සේගේ ප්‍රේමයේ හස්තවලින් සදාකාලිකවම වටවී සිටීමට"[10] අපට හැකිවේවා,

**සටහන**

1. මතෙව් 2:2.
2. මතෙව් 4:19.
3. යොහාන් 1:43.
4. මතෙව් 9:9.
5. දහම සහ ගිවිසුම 38:22.
6. දහම සහ ගිවිසුම 64:34.
7. බලන්න ලූක් 2:7.
8. ලූක් 2:10-11.
9. දහම සහ ගිවිසුම 88:33.
10. 2 නෙෆී 1:15.

## මෙම පණිවුඩයෙන් ඉගැන්වීම

සභාපති මොන්සන් අපව කැඳවන්නේ "අපගේ ජීවිතවලට සහ අපගේ නිවාසවලට ක්‍රිස්තුස්වහන්සේ රැගෙනඒමට අභිප්‍රාය සහ කැපවීම ඇතිකරගන්නා ලෙසය." ඔබ උගන්වන අය සමග ඔවුන් පුද්ගලිකව මෙන්ම පවුලක් ලෙසද, මෙම අභිප්‍රාය සහිත උත්සාහය ඇතිකරගන්නේ කෙසේදැයි සාකච්ඡාකිරීම ගැන සලකාබලන්න. මෙම නත්තලේදී බැහැදැකීමට හෝ සේවයකිරීමට යම් විශේෂිත පුද්ගලයෙක් හෝ පවුලක් ගැන සිතීමට ඔවුනගෙන් ඉල්ලාසිටීමට ඔබට හැකිය. ඔබ බැහැදකින අයගෙන් ඇසීමට සලකාබැලීමට ඔබට හැකිය. "උපකාරක හස්තයක්, ආදරණීය සිතක් සහ ප්‍රියමනාප ආත්මයක් දිගුකිරීමට මේ වසරේ තවමත් කාලය ඇත.."

## තරුණ අය

### නත්තල් කාලයේ සේවයකිරීමට මාර්ග

සභාපති මොන්සන්, වයසක අය සහ සාත්තු නිවාසවල සිටින අය, විශේෂයෙන්ම නත්තල් කාලයේදී, බැලීමට යාමට කාලය වෙන්කරයි. තමන් බැලීමට එන අය නිසා සතුටට පත්වන අය සිටින අතර, තවත් අය කිසිදා එන්නේ නැති අය ගැන බලාරොත්තුව සිටින බව සභාපති මොන්සන් සඳහන්කරයි. යමෙක් එන තුරු බලාසිටින අය ඇත—මේ නත්තලේදී, සමහරවිට ඒ තැනැත්තා ඔබ විය හැකිය.

පහත සඳහන් වන්නේ මෙම නත්තලේදී කිසිවෙක් හුදකලාවෙන් නොසිටින බව වගබලාගැනීමට ඔබට උපකාරවත් විය හැකි මාර්ග කිහිපයකි. මෙම කාලයේදී ඔබගේ සමාජයේ ඔබට ලඟාවිය හැකි තවත් මාර්ග ගැන නිදහසේ සිතන්න. "ඔබගේ පැමිණීම බලාපොරොත්තුව යමෙක් සිටීද?"

- ඔබගේ කොට්ඨාශයේ හෝ ශාඛාවේ ධර්මදූතයන්ට හෝ තනි හෝ වයසක සාමාජිකයන්ට යැවීමට නත්තල් කාඩ් සකස්කරන්න.
- ප්‍රාදේශීය සමාජ සංවිධානයකට ස්වේච්ඡාවෙන් ඉදිරිපත්වන්න.
- ඔබගේ මිතුරන්ට සහ අසල්වැසියන්ට මෝර්මන්ගේ පොතේ පිටපත් නත්තල් ත්‍යාග ලෙස දෙන්න.
- ඔබගේ කොට්ඨාශයේ හෝ පවුලේ වයසක අය බැහැදැකීමට යන්න.
- ඔබගේ අසල්වැසියන්ට දීමට කෑමක් සකස්කරන්න.

## ළමයි

### ආලෝකය අනුව යන්න

යේසුස්වහන්සේ උපත ලැබීමෙන් පසුව, ශාස්තාවන්තයෝ උන්වහන්සේට ත්‍යාග ගෙනාවෝය. උන්වහන්සේව සොයාගැනීම සඳහා ඔවුහු අහසේ අළුත්, දීප්තිමත් තරුවක් අනුව ගියෝය. මෙම නත්තලේදී යේසුස්වහන්සේට දීමට ඔබට තිබෙන්නේ කුමන ත්‍යාගයක්ද?

© 2015 Intellectual Reserve, Inc. විසිනි. සියලු හිමිකම් ඇවිරිණි. ශ්‍රී ලංකාවේ මුද්‍රණයකරන ලදී. ඉංග්‍රීසි අනුමැතිය: 6/15. පරිවර්තන අනුමැතිය: 6/15. *First Presidency Message, 2015 December* පරිවර්තනයයි. Sinhala. 12592 408

ඇදහිල්ල, පවුල, සහනය

# යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ දිව්‍යමය ගති ලක්ෂණ: සානුකම්පිතබව සහ කරුණාව

*මෙම ලිපිය යාච්ඤාවෙන් යුතුව අධ්‍යයනයකර, බෙදාගන්නේ කුමක්දැයි දැනගැනීමට සොයන්න. ගැලවුම්කරුවාණන්ගේ දිව්‍යමය ගුණාංග තේරුම්ගැනීමෙන්, උන්වහන්සේ තුල ඔබගේ ඇදහිල්ල වැඩිවී බැහැදැක ඉගැන්වීම තුලින් ඔබ රැකබලාගන්නා අය ආශිර්වාදිතවන්නේ කෙසේද? වැඩිදුර තොරතුරු සඳහා යන්න,* ***reliefsociety.lds.org***

*මෙය ගැලවුම්කරුවාණන්ගේ ගති ලක්ෂණ පෙන්වන බැහැදැක ඉගැන්වීමේ පණිවුඩ මාලාවක එක් කොටසකි*

"ශුද්ධලියවිලිවල අනුකම්පාව යනු, 'යමෙක් වෙනුවෙන් දුක්වීමයි,' එහි තවත් අදහසක් නම්, තවත් කෙනෙකුට අනුකම්පාව, දයාවන්තකම සහ කරුණාව දැක්වීමයි."[1]

"සානුකම්පාව සම්බන්ධව යේසුස්වහන්සේ බොහෝ ආදර්ශ ලබාදුන්හ," යයි සභාපති තෝමස් එස්. මොන්සන් කීවේය. "බෙතෙස්ඩා පොකුණේ කොරවූ පුද්ගලයා, අනාචාරයේ හැසිරුන ස්ත්‍රිය; යාකොබ්ගේ ළිඳ ළඟ ස්ත්‍රිය; යායිරස්ගේ දියණිය; ලාසරුස්; මරියා සහ මාර්තාගේ සොහොයුරා—මේ හැම කෙනෙක්ම යෙරිකෝ මාර්ගයේ තුවාලකාරයා නියෝජනය කර ඇත. හැම අයෙකුටම උපකාර අවශ්‍යව තිබින.

"බෙතෙස්ඩා පොකුණේ කොරවූ පුද්ගලයාට, 'නැගිට නුඹගේ යහන රැගෙන ඇවිද පලයන්න' යයි යේසුස්වහන්සේ කීසේක. පාපයෙන් පිරි ස්ත්‍රියට මෙම උපදේශය ලැබුනි, 'පලයන්න, තවත් පව් නොකර සිටපන්න' වතුර ගැනීමට ආ ළුැයට උපකාර පිණිස, උන්වහන්සේ, 'සදාකාල ජීවනය නික්මෙන්නාවූ වතුර උල්පතක් වන්නේ යයි' ලිං වතුර දුන්සේක. යායිරස්ගේ මියගිය දියණියට මෙම නියෝගය ආවේය, 'යෞවනිය නැගිටපන්නැයි නුඹට කියමි,' සොහොනේ සිටි ලාසරුස්ට, 'පිටතට වරෙන්න යයි කීසේක.'

ගැලවුම්කරුවාණන්වහන්සේ නිතරම අසීමිතව අනුකම්පාව පෙන්වූසේක. … අපි අපගේ හදවතේ දොරවල් විවරකරමු,, එනම් උන්වහන්සේ—සැබෑ අනුකම්පාවේ ජීවමාන ආදර්ශය—ඇතුල්වන සේක"[2]

## *අමතර ශුද්ධ ලියවිලි*

ගීතාවලිය 145:8; සෙකරියා 7:9;
1 පේත්‍රුස් 3:8; මොසායා 15:1, 9;
3 =6නෙපී 17:5–7

## *ශුද්ධ ලියවිලිවලින්*

මම මගේ ස්වාමිපුරුෂයා සමග අපගේ 17 හැවිරිදි දියණියගේ ඇඳ ළඟ දණගසා, ඇයගේ ජීවිතය වෙනුවෙන් ආයාචනා කළෙමි. යයි ලින්ඩා එස්. රීව්ස්, සහන සමිතියේ ප්‍රධාන සභාපතිත්වයේ දෙවන උපදේශිකාව කීවාය, "පිළිතුර වූයේ නැත යන්නය, නමුත්. … [ගැලවුම්කරුවාණන්] අපගේ … දුකේදී… අපට අනුකම්පා කළ බව අපි දැනගත්තෙමු."[3]

"ගැලවුම්කරුවාණන්ගේ ජීවිතයේ මා ඉතා ප්‍රියකරන කථාවක් නම්, ලාසරුස්ගේ කතාවයි, ශුද්ධ ලියවිලි අනුව 'යේසුස්වහන්සේ මාර්තාට, … ඇයගේ සහෝදරී [මරියාට] සහ [ඔවුන්ගේ සහෝදර] ලාසරුස් ප්‍රේමකළ බව අපට කියයි.'"[4] ලාසරුස් අසනීපව සිටියදී යේසුස්වහන්සේට දන්වා යැවූ නමුත්, උන්වහන්සේ එන විට ලාසරුස් මියගොස් සිටියේය. මරියා යේසුස්වහන්සේ වෙත දිවගොස්, උන්වහන්සේගේ දෙපාළඟ වැටී, හැඬුවාය. "උන්වහන්සේ ආත්මයෙන් සුසුම්ලා කැළඹී…හැඬූසේක" (යොහාන් 11:33, 35).

"අපගේ වගකීම එයයි. අප අප ගැනම හැඟීමක් ඇතිකරගෙන, ඉන්පසුව, ස්වර්ගික පියාණන්වහන්සේගේ දරුවන්ට උපකාර කළ යුතුය. අපගේ ගැලවුම්කරුවාණන් අපගේ සියලු පව් පමණක් නොව නමුත්, අපගේ වේදනා, අපගේ දුක් සහ හිරිහැරද තමන්වහන්සේ මත ගත්බව අත්විඳ, බලා දැකගත යුතුය. එවිට අපට හැඟෙන දෙය දැනගෙන, අපව සනසන අන්දම ගැන උන්වහන්සේට දැනගත හැකිවන්නේය."[5]

**සටහන්**

1. Guide to the Scriptures, "Compassion."
2. "The Gift of Compassion," ලියහෝනා, මාර්. 2007, 4–5, 8.
3. ලින්ඩා එස්. රීව්ස්. "The Lord Has Not Forgotten You," ලියහෝනා, නොවැ. 2012, 120.
4. ලින්ඩා එස්. රීව්ස්. "The Lord Has Not Forgotten You," 118.
5. ලින්ඩා එස්. රීව්ස්. "The Lord Has Not Forgotten You," 120.

***මේ ගැන සිතා බලන්න***

**ඔබගේ අනුකම්පාවෙන් කවරෙක් ප්‍රයෝජනය ලබන්නේද?**

© 2015 Intellectual Reserve, Inc. විසිනි. සියලු හිමිකම් ඇව්රිණි. ශ්‍රී ලංකාවේ මුද්‍රණයකරන ලදී. ඉංග්‍රීසි අනුමැතිය: 6/15. පරිවර්තන අනුමැතිය: 6/15. *Visiting Teaching Message, December 2015* පරිවර්තනයයි. Sinhala. 12592 408